


**මෙම සමාගමේ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොල / කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල පවතින පහත සඳහන් තනතුරෙහි පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## කාර්මික ශිල්පී (ඔටෝමොබයිල්)11 වන ශ්‍රේණිය

**රැකියාවේ සවභාවය :** අධීක්ෂක නිළධාරීන්ගේ අධීක්ෂණය යටතේ සියළුම වාහන හා බර උපකරණ සම්බන්ධ දෝෂ හඳුනා ගැනීම, අළුත් වැඩියා කිරීම හා නඩත්තු කිරීම.

**රැකියාවේ වගකීම් :**

1 සියළුම වාහන සහ අනෙකුත් අදාළ මෝටර් යාන්ත්‍රික උපකරණ වල අළුත් වැඩියා කටයුතු සිදු කිරීම.

11 ඉලෙක්ට්‍රොනික පාලන පද්ධති සහිත මෝටර් රථ, දෙමුහුම් වර්ගයේ මෝටර් රථ නඩත්තු කටයුතු හා අළුත් වැඩියා කිරීම

111 බර යන්ත්‍ර/උපකරණ වල ද්‍රාව පද්ධති අළුත් වැඩියා කිරීම.

IV ස්කැනර් යන්ත්‍ර භාවිතය හා දෝෂ හඳුනා ගැනීමේ හැකියාව

V සියළුම වාහනවල සහ අදාළ උපකරණ වල පෙර ලැයිස්තු ගත සේවා සහ පූර්ව නඩත්තු අධීක්ෂණය නිළධාරීන්ගේ උපදෙස් හා අධික්ෂණය යටතේ පවත්වා ගෙන යාම හා විශේෂිත තත්ත්වයන් පිළිබඳව නිළධාරීන් දැනුවත් කිරීම.

VI සියළුම වාහන සහ උපකරණ වල හදිසි බිඳවැටීම් සඳහා ක්ෂණිකව ක්‍රියාකාරී වී නිවැරදි කිරීම හා ඒ සම්බන්ධ අදාළ අංශ සමග මනා සන්නිවේදනයකින් හා සහයෝගයෙන් කටයුතු කිරීම.

VII රියැදුරු මහත්වරුන්ගෙන් වාහන බාරගෙන පරීක්ෂාවෙන් පසු නඩත්තු කටයුතු සිදු කිරීම හා විශේෂිත තත්ත්වයන් පවතී නම් රියැදුරු මහතා සහ අධීක්ෂණ නිළධාරීන් දැනුවත් කිරීම

VIII වාහන සහ උපකරණවල පෙර ලැයිස්තුගත පරීක්ෂණ කිරීම් කල යුතු අතර අදාළ වාර්තා නිසලෙස පවත්වාගෙන යාම.

XI අධීක්ෂණ නිළධාරීන් විසින කලින් කලට පවරනු ලබන අනෙකුත් සේවා කටයුතු සඳහා සහභාගී වීම.

X තම සේවා කටයුතු වලට අදාළ දෛනික වාර්තා සටහන් පොත් නිසි පරිදි පවත්වාගෙන යාම.

VIII හදිසි ආපාදාකාරී අවස්ථාවන් වලදී ගුවන් තොටුපොලහි නඩත්තු කටයුතු සඳහා ක්‍රියාකාරීව සහභාගී වීම.

02/-

**සුදුසුකම් :**

(අ) ජාතික ආධුනිකත්ව මණ්ඩලයෙන්/ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කරීමේ අධිකාරියෙන් නිකුත් කරනු ලැබූ ඔටෝමොබයිල් ක්ෂේත්‍රයේ දැවුරුද්දකට (02)නොඅඩු පූර්ණ කාලීන පාඨමාලා සහතිකයක් හෝ දැවුරුද්දකට (02) නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් හැදෑරීමෙන් අනතුරුව කාර්මික විද්‍යාලයක් මගින් නිකුත් කරනු ලැබූ වෘත්තීය ආධුනිකත්ව සහතිකයක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.

**හෝ**

(ආ) ජාතික වෘත්තීය සුදුසුකම් 4 වන මට්ටම (NVQ Level 4) වෘත්තීය සහතිකයක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබිම.

**සහ**

(ඇ) ආධුනිකත්ව කාලසීමාවද/පාඨමාලා කාල සීමාවද ඇතුලත්ව සිව් (04) වසරක පළපුරුද්දක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබිම.

**වයස :**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන විට අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

**වැටුප :**

තෝරාගනු ලබන්නන් හට සයළු දීමනා සහිත ආකර්ෂණීය වැටුපක් හා ප්‍රතිලාභ රැසක් හිමිවේ.

**බඳවා ගැනීමේ ක්‍රමය** ප්‍රායෝගික පරික්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

**පොදු කරුණු :-**

ඉහත තනතුර සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ පිහිටි ඕනෑම ගුවන් තොටුපොලක අවශ්‍ය වූ විට සේවය කල යතුවේ.

ඉහත සුදුසුකම් හා සේවා පළපුරුද්ද ලබා තිබේ නම් මෙම වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස් කල අයදුම්පත්‍රයක් පහත සඳහන් ලිපිනයට **2023 ඔක්තෝබර් මස 16 වන දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් හෝ කුරියර් සේවා මගින් පමණක්** ඉදිරිපත් කළ යුතුවේ. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ **කාර්මික ශිල්පී (ඔටෝමොබයිල්) II වන ශ්‍රේණිය** යන තනතුර සඳහන් කළ යුතුවේ.

තෝරා ගැනීමේ ක්‍රියාවලියේ සෑම අදියරකදීම සුදුසුකම්ලත් අයදුම්කරුවන්ට පමණක් දැනුම් දෙනු ලැබේ.

පාඨමාලා සහතික හා සේවා සහතික සහ අදාළ සහතිකවල ජායා පිටපත් සමග ඉදිරිපත් නොකරන අයදුම්පත් සහ අපගේ වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සභාපති**

**එයාර්පෝර්ට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) (ප්‍රයිවට්) ලිමිටඩ්**

**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල**

**කටුනායක**

Date: 04/10/2023